# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2343/05 - 2023 ජූලි මස 31 වැනි සඳුදා - 2023.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2023 ජූලි මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2023 ජූලි මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි ''අංක 02. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 71 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

72. සහස්‍යා ඉන්වෙස්මන්ට් ලිමිටඩ්
73. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

1A - G 40005 — 361 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි " අංක 10. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන්;

2. සහස්‍යා ඉන්වෙස්මන්ට් ලිමිටඩ්

(3) එම නිවේදනයෙහි "අංක 14. කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 40 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

41. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රටතුල වගා කිරීම සඳහා කටයුතු කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 41 සහ 42 අයිතමයන් පිළිවෙලින් අංක 42 සහ 43 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(4) එම නිවේදනයෙහි " අංක 16. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි III වැනි තීරුවෙහි " ප්‍රජා පාදක විශෝධන පනත (1999 අංක 46)" අයිතමයට පසුව පහත අයිතමය ඇතුලත් කිරීමෙන්;

- පුනරුත්ථාපන කාර්යාංශය පනත (2023 අංක 2)

(5) එම නිවේදනයෙහි " අංක 18. වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන්;

27. ත්‍රිපෝෂ සහ සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රටතුල වගා කිරීම සඳහා කටයුතු කිරීම

(6) එම නිවේදනයෙහි " අංක 20. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන්;

27. උචිත තාක්ෂණය උපයෝගි කර ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(ආ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන්;

13. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

(ඇ) එහි III වැනි තීරුවෙහි " වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57)" අයිතමයට පසුව පහත අයිතමය ඇතුලත් කිරීමෙන්;

- පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත (2022 අංක 3)

(7) එම නිවේදනයෙහි " අංක 22. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 19 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

20. අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය

(ආ) එහි III වැනි තීරුවෙහි " ගාලු උරුමය පදනම පනත (1994 අංක 7)" අයිතමයට පසුව පහත අයිතමය ඇතුලත් කිරීමෙන්;

- අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත (2018 අංක 27)

EOG 07 - 0291

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.